**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී පනවනු ලබන දඩය සහ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව නිශ්චිතව දැක්වීම සහ මේ වගන්තියේ විධිවිධාන කඩකරනු ලැබූ අවස්ථාවක ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට අවශ්‍ය කාර්ය පටිපාටිය දැක්වීමය.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී පනවනු ලබන දඩය සහ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව නිශ්චිතව දැක්වීම සහ මේ වගන්තියේ විධිවිධාන කඩකරනු ලැබූ අවස්ථාවක ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට අවශ්‍ය කාර්ය පටිපාටිය දැක්වීමය.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී පනවනු ලබන දඩය සහ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව නිශ්චිතව දැක්වීම සහ මේ වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ අවස්ථාවක ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට අවශ්‍ය කාර්ය පටිපාටිය දැක්වීමය.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සංස්ථාවේ නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනෙකු වෙනස් කිරීමය.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සංස්ථාවේ බලතල පුළුල් කිරීමය.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වළක්වන ආඥාවක් ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් සඳහා වන කාර්ය පටිපාටිය දැක්වීමය.

***8 වන වගන්තිය :*** පොලිස් නිලධරයකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන වැරදි යන නව වගන්ති මේ වගන්තිය මගින් හඳුන්වා දෙනු ලබයි.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දණ්ඩනයක් පනවා නොමැති අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක් සඳහා විධිවිධාන සැලැස්වීමය.

***10 වන වගන්තිය :*** නව අර්ථ නිරූපණ ඇතුළත් කිරීම සඳහා මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබයි.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන නඩු ආදිය මෙම සංශෝධනයෙන් පසුව ද පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සලසනු ලබයි.

